12815

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
*All Rights Reserved]*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියට බඳවා ගැනීම සඳහා වන
විවෘත තරග විභාගය - 2011 (2012)

## (02) රචනය හා සාරාංශය

පැය දෙකයි

ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

**1.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **එකක්** තෝරාගෙන විශ්ලේෂණාත්මකව හා තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරමින් වචන සංඛ්‍යාව **250 - 300** අතර වන සේ වාක්‍ය රචනයක් ලියන්න.

(i) අපක්ෂපාතී හා ජනහිතකාමී සේවයක් සැලසීමේ දී ශ්‍රී ලාංකේය පරිපාලන සේවා නිලධාරීන්ට මුහුණ පෑමට සිදු විය හැකි ගැටලු හා අභියෝග

(ii) ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය දැන්වීම් ප්‍රචාරණය තුළින් පිළිබිඹු වන ප්‍රමිතිය, විශ්වසනීයත්වය හා යෝග්‍යතාව

(iii) ලෝක බලවතුන්ගේ සම්බාධක හා වාරණ නියෝග මගින් සංවර්ධනය වන රටවල් කෙරෙහි ඇති කෙරෙන බලපෑම්

(iv) බහු ජනවාර්ගික, බහු ආගමික හා බහු භාෂික සමාජ පවත්නා රටවල ගැටුම් නිරාකරණයේ දී හා සහජීවනය ගොඩනැංවීමේ දී උපයෝගී කර ගැනීමට යෝග්‍ය උපාය මාර්ග

(v) ලෝකයේ ඇතැම් රටවල පවත්නා ආර්ථික උද්ධමනය හා මූල්‍ය අර්බුද හමුවේ රාජ්‍ය පාලකයන් සහ මහජනතාව අතර උද්ගත විය හැකි මතවාද හා විරෝධතා

(vi) කාර්මිකකරණය හා වාණිජකරණය නිසා කවර රටක වුව ද සංස්කෘතිය හා සාරධර්ම ආශ්‍රිතව නව ප්‍රවණතා ඇතිවීම ස්වාභාවික ධර්මතාවකි.

**2.** පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ** වන සේ සාරාංශ කොට ලියා, යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. (සාරාංශය අවසානයේ ඔබ යෙදූ වචන ගණන ද ලියන්න.)

ශ්‍රී ලංකාව විසින් 2005 වසරේ ජූලි සිට 2008 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා GSP+ සහනය ලබා ගන්නා ලදී. GSP+ සහනයෙහි ප්‍රතිලාභ ලබන රටවල් 16 අතරට ශ්‍රී ලංකාව ද අයත් වන අතර, GSP+ යටතේ පවතින අමතර පහසුකම් ලබාගැනීම සඳහා සුදුසුකම් ලැබූ එකම ආසියාතික රට ද ශ්‍රී ලංකාව වෙයි.

GSP+ සහනය ලබා දෙන්නේ නැවත අලුත් කිරීමේ පදනම මත බැවින් මෙම පහසුකම් තවදුරටත් ඉදිරියට පවත්වා ගෙනයාමේ දී අවිනිශ්චිතතාවක් ඇති විය හැකි බව, විශේෂයෙන් ම 2008 දෙවන භාගය අතර කාලය තුළ මේ පිළිබඳව අදාළ සියලු ම පාර්ශ්වයන් විසින් දැනුවත් වී තිබිණ. එසේ වුව ද GSP+ සහනය ආරම්භයේ දී ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට, යුරෝපා සංගමයේ රටවල වෙළඳපොළ වෙත ළඟාවීමට සහ ඔවුන්ගේ නිෂ්පාදනවල පවතින ඉහළ ගුණාත්මකභාවය මෙන්ම සිය නිෂ්පාදන නියමිත වේලාවට ලබාදීමේ හැකියාව ද පෙන්වීමට අවස්ථාවක් ලැබිණ. එබැවින්, ජාත්‍යන්තර වෙළඳ සැලසුම් සඳහා සහභාගීවීමෙන් ලද අත්දැකීම් සහ කීර්ති නාමය තුළින් සිය නිෂ්පාදන තවදුරටත් දියුණු කිරීම සඳහා අවශ්‍ය ශක්තිය ලබාදීම සහ ඒ සඳහා ඔවුන් උනන්දු කරවීම මෙන්ම, ඔවුන්ගේ ඵලදායිතාව වැඩිකර ගැනීමට සහ වෙළඳපොළ පුළුල් කර ගැනීම උදෙසා නව වෙළඳපොළ ග්‍රහණය කර ගැනීමේ ක්‍රමවේද සකස් කර ගැනීමට ද හැකියාව ලැබිණ.

යම් හෙයකින් මෙම සහනය ලබාදීම නවතා දැමීමට තීරණය කරනු ලැබුවහොත්, කර්මාන්තවලට විවිධ අයුරින් බලපෑම් ඇති විය හැකි ය. බදු සහනය මත බොහෝදුරට රඳා පවතින සහ තම ව්‍යාපාර කටයුතු සිදුකර ගෙන යන ක්‍රමයෙහි වෙනස්කම් සිදු නොකරන සමහර කර්මාන්ත මත දැඩි අහිතකර බලපෑම් ඇති විය හැකි ය. කෙසේ වුවත් GSP+ සහනයන් නොමැති වූ පරිසරයකට හැඩගැසීම සඳහා වඩා හොඳ කළමනාකාරී ක්‍රම භාවිතය සහ නව තාක්ෂණික ක්‍රම යොදා ගැනීම හරහා නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම වැනි පියවර ගන්නා ලද කර්මාන්තවලට ඉහත අභියෝගයට සාර්ථක අන්දමින් මුහුණ දීමට හැකිවනු ඇත. විශේෂයෙන් ම, ඇඟලුම් කර්මාන්තය ද ලොව පවතින උසස් තත්ත්වයේ පහසුකම් සහ යටිතල පහසුකම් යොදා ගනිමින් සිය තරගකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා උත්සාහ දරමින් සැලකිය යුතු දියුණුවක් ලබා ඇත.

GSP+ සහනය අහෝසි වීම සිදු වුවහොත් කර්මාන්තකරුවන් සහ අපනයනකරුවන් තරගකාරිත්ව ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සිය නිෂ්පාදන ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව ඉහළ නංවමින් ඔවුන්ගේ ඵලදායිතාව වැඩි කිරීමට උත්සුක වනු ඇති අතර, එමෙන් ම, ඔවුන්ගේ නිෂ්පාදන විවිධාංගීකරණයක් ඇති කිරීමට සහ නව වෙළඳපොළවල් සොයා යාමට උනන්දුවීමෙන් ශ්‍රී ලාංකේය අපනයන දීර්ඝකාලීනව වඩාත් තරගකාරී වනු ඇත.

* * *

EXAMMOOD.LK